මස්කෙළිය ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
-------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 පෙබරවාරි 20 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 21 දින ද විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2020 ජුනි 19 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මස්කෙළිය ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
----------------------------------------------

ගිණුම්කරණ අඩුපාඩු
------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | වර්ෂයේ ජල ගාස්තු බිල් කිරීම් රු.108,600 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම රු.113,351 ක් අඩුවෙන්ද, ලැබිය යුතු මුද්දර ගාස්තු රු.226,000 ක් වැඩියෙන්ද ගිණුම්ගත කර තිබූ අතර 2019 ජූලි සිට දෙසැම්බර් දක්වා කාලයට ලැබිය යුතු මුද්දර ගාස්තු ගිණුම්ගතකර නොතිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2020 වර්ෂයේදී මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී නිවැරදි කිරීමට කටයුතු කරමි. |
| (iii) | ඉකුත් වර්ෂයට අදාළව ගෙවා තිබුණු රු.93,150 ක් වූ විගණන ගාස්තුව සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිවැරදිව ගිණුම් තැබීමට කටයුතු කළ යුතු වේ. | 2019 විගණන ගාස්තු වෙනුවෙන් වෙන්කිරීම් සිදු නොකළ නිසා වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කරන ලදී. |

1.4 අනුකූල නොවීම්

1.4.1 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

| | නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2006 අංක 12 දරන මුද්දර ගාස්තු පනත | සභාව විසින් රැස්කරන ලද රු.115,649 ක මුද්දර බදු දේශීය ආදායම් කොමසාරිස් වෙත ප්‍රේෂණය කර නොතිබුණි. | අදාළ නීති ප්‍රකාරව බදු ප්‍රේෂණය කිරීමට කටයුතු කළ යුතු වේ. | නව සභාවක් නිසා දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි වී නොමැත. දැනට ලියාපදිංචිය සඳහා කටයුතු කරමින් පවතී. |
| (අ) | ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති 218 | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි පිළිබඳ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි. | සමීක්ෂණය සිදු කර වාර්තා කිරීමට කටයුතු කළ යුතු වේ. | සමීක්ෂණයක් සිදු කිරීමට නියමිතය. |
| (ආ) | මුදල් රෙගුලාසි අංක 880 | ඇප ආඥා පනත අනුව රජයේ නිලධාරින්ගෙන් ඇප මුදල් ලබාගෙන නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරින්ගෙන් ඇප ලබාගත යුතු වේ. | අඹගමුව ප්‍රාදේශිය සභාවෙන් අනුයුක්ත කළ නිලධාරීන්ගෙන් ඇප මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන අතර සෙසු නිලධාරීන්ගෙන් වැටුපෙන් අය කිරීම ආරම්භ කර ඇත. |
| (ඇ) | 1988 මැයි 17 දිනැති අංක 1988/22 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛය | වරිපනම් බදු සඳහා දේපළ තක්සේරුව වසර 05 කට වරක් සිදුකළ යුතු වුවත් 2010 වර්ෂයට පසුව දේපළ තක්සේරුවක් කර නොතිබුණි. | තක්සේරුව කරවා ගැනීමට කටයුතු කළ යුතු වේ. | දේපළ තක්සේරුව සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවන් ඉල්ලීම් කර ඇත. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.2,897,062 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මාස 09 ක පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු. 3,561,162 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

| ආදායම් ප්‍රභවය | 2019 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2018 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,181,100 | 3,011,447 | 3,702,781 | 2,009,220 | 4,980,000 | 2,630,061 | 1,990,272 | 2,087,370 |
| කුලී | 7,563,000 | 7,438,974 | 5,182,895 | 4,370,343 | 7,010,000 | 9,230,220 | 8,599,575 | 2,099,165 |
| බලපත්‍ර ගාස්තු | 2,330,000 | 800,000 | 947,531 | - | 1,350,000 | 870,473 | 870,473 | - |
| වෙනත් ආදායම් | 5,590,000 | 565,793 | 1,520,500 | 7,090,712 | 3,690,000 | - | 7,538,626 | - |
| | 21,664,100 | 11,816,214 | 11,353,707 | 13,470,275 | 17,030,000 | 12,730,754 | 18,998,946 | 4,186,535 |

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ටෙන්ඩර් මඟින් බදුදෙන දේපළවලින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.2,255,250 ක මුදලක් හිඟව පැවතුණි. | හිඟ මුදල් අය කරගෙන වාර්තා කිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අය කරගැනීම සඳහා නීත්‍යානුකූල කටයුතු ආරම්භ කර ඇත. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| උසාවි දඩ රු.1,997,080 ක් හා මුද්දර ගාස්තු රු.305,000 ක් අයවිය යුතුව තිබුණි. | මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතු වේ. | මුද්දර ගාස්තුවලින් රු.988,414 ක් ලැබී ඇත. උසාවි දඩ මුදල් ඉල්ලීම් කර ඇත. |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටුකළ යුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

(අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ශ්‍රි පාද වන්දනා සමය තුළ බැතිමතුන්ට පහසුකම් සැලසීම, ආදායම් අයකර ගැනීම, පෞද්ගලික වාහන නැවතුම්පොළවල් සහ තවකාලික වෙළදාම් පාලනය වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා නොතිබුණි. | අදාළ අතුරු ව්‍යවස්ථා පැනවීමට කටයුතු කළ යුතු වේ. | සම්මත අතුරු ව්‍යවස්ථා දෙකක් ගැසට් කර ඇත. ශ්‍රීපාද වන්දනා සමයට අදාළව අතුරු ව්‍යවස්ථාවක් පැනවීමට කටයුතු කරමි. |

(ආ) ආයුර්වේද ප්‍රතිකාර සේවය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| සභාව සතු ආයුර්වේද මධ්‍යස්ථානයට වෛද්‍යවරයෙකු අනුයුක්ත නොකිරීම නිසා 2018 ඔක්තෝබර් සිට මධ්‍යස්ථානය වසා දමා තිබුණි. රෝගී සත්කාර සේවය ක්‍රියාත්මකව නොතිබීම නිසා රු.428,608 ක් වටිනා ආයුර්වේද ඖෂධ තොගයක් නිෂ්කාර්යව පැවතුණි. | රෝගී සත්කාර සේවය හැකි ඉක්මනින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතු වේ. | විශ්‍රාමික ආයුර්වේද වෛද්‍ය නිළධාරිනියක් සේවයේ යෙදවීමට අවශ්‍ය ලියවිලි රාජ්‍ය සේවා කොමිෂමට යොමුකර ඇත. |

(ඇ) පරිසර බලපත්‍ර

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මස්කෙළිය ප්‍රාදේශිය සභාව 2018 වර්ෂයේදි ස්ථාපිත කළ පසුව, ප්‍රාදේශිය සභා බල සීමාව තුළ ලබා දිය යුතු පරිසර බලපත්‍ර ලබා දී නොතිබුණි. | අදාළ ව්‍යාපාරවලට පරිසර බලපත්‍ර නිකුත් කිරීමට කටයුතු කළ යුතු වේ. | පරිසර බලපත්‍ර ලබා දීමේ බලතල 2020 පෙබරවාරි 02 දින ලැබී ඇති නිසා මේ වනවිට අදාළ කටයුතු ආරම්භ කර ඇත. |

(ඇ) ඝණ අපද්‍රව්‍ය කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) රිකාටන් ප්‍රතිචක්‍රිකරණ මධ්‍යස්ථාන භූමියේ වැසිකිළි අපද්‍රව්‍ය කළමනාකරණය කිරීම සඳහා 2016 වර්ෂයේදී රු.1,376,267 ක වියදමක් දරා නිමකර තිබුණු පද්ධතියේ ඉදිකිරීම් කටයුතු අවසන්කර භාවිතයට නොගැනීම නිසා නිෂ්කාර්යව පැවතුණි. | හැකි ඉක්මනින් අදාළ සේවා කටයුතු ආරම්භ කිරීමට කටයුතු කළ යුතු වේ. | රිකාටන් කළමනාකරණ මධ්‍යස්ථානයේ පවතින ගලිවලේ වැඩකටයුතු අවසන් කර ඇත. සභාවට ගලි බවුසරයක් මිලදීගත් පසු අදාළ කටයුතු ආරම්භ කිරීමට නියමිතව පවතී. |
| (ii) නල්ලතන්නිය ශ්‍රී පාද වන්දනා වාහන නැවතුම් ස්ථානයේ සනීපාරක්ෂක සේවා සැපයීම අඩාල වීම නිසා වන්දනාකරුවන් අපහසුතාවයන්ට ලක්ව තිබුණි. | අදාළ කටයුතු හැකි ඉක්මනින් නිමකර වාර්තා කිරීමට කටයුතු කළ යුතු වේ. | වැසිකිළි වළවල් සකස් කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර ඇති අතර ප්‍රතිපාදන ලැබීමෙන් අනතුරුව ඉදිරි වැඩකටයුතු ක්‍රියාත්මක කිරීමට නියමිතය. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතාවය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2018 වර්ෂයේදී ලැබී තිබූ ගොඩනැගිලි අයදුම්පත්‍ර 67 කින් අවසර පත්‍ර නිකුත් කර තිබුණේ 34 කට පමණි. | අදාළ කටයුතු යාවත්කාලීන කර අනවසර ඉදිකිරීම් සම්බන්ධව පසුවිපරම් සිදු කිරීමට කටයුතු කළ යුතු වේ. | 2018 වර්ෂයේ ගොඩනැගිලි අයදුම්පත් සම්බන්ධ අඩුපාඩු සම්පූර්ණ කරමින් පවතින අතර අනවසර ඉදිකිරීම් සම්බන්ධව ජංගම සේවය මඟින් පරීක්ෂා කිරීමට කටයුතු කරමින් පවතී. |

3.3 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| තනතුරු 16 ක පුරප්පාඩු 70 ක් පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. | බඳවා ගැනීම් තාවකාලිකව අත්හිටුවා ඇත. |

3.4 වත්කම් කළමනාකරණය

3.4.1 වාහන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| අළුත්වැඩියා කටයුතු සඳහා 2018 දෙසැම්බර් 31 දින ගරාජයකට යොමුකර තිබුණු සභාවට අයත් කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු 2019 දෙසැම්බර් 31 දින වන විටද ආරම්භ කර නොතිබුණි. | කඩිනමින් අළුත්වැඩියා කටයුතු සිදු කර ධාවනයේ යෙදවීමට කටයුතු කළ යුතු වේ. | අළුත්වැඩියාව සඳහා ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබී ඇතත් සභාවේ මූල්‍ය තත්ත්වය ප්‍රමාණවත් නොවන බැවින් පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ප්‍රතිපාදන ඉල්ලුම් කර ඇත. |

3.4.2 හඳුනාගත් පාඩු

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| ආයුර්වේද මධ්‍යස්ථානයේ 2018 දෙසැම්බර් 31 දිනට රු.12,718 ක් වටිනා ඖෂධ වර්ග 14 ක් සහ 2019 වර්ෂයේදී රු.6,822 ක් වටිනා ඖෂධ වර්ග 3 ක් කල් ඉකුත්වී තිබුණි. | සැපයුම් ක්‍රියාවලිය ප්‍රශස්ථ අයුරින් තබාගත යුතු වේ. | භාණ්ඩ සමීක්ෂණය මගින් කල් ඉකුත්වූ බෙහෙත් වර්ග ඉවත් කර ඇත. ඉතිරි බෙහෙත් අඹගමුව ප්‍රාදේශය සභාව වෙත ලබාදීමට ලිපි යොමුකර ඇත. රෝග සත්කාර සේවා පැවැත්වීම මගින් ඉතිරි බෙහෙත් වර්ග භාවිතා කිරීමට සුදානම් කර ඇත. |

4. ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 1988 ප්‍රාදේශීය සභා මූල්‍ය හා පරිපාලන රීති 193 අනුව අයවැයගත මූල්‍ය ප්‍රතිපාදන සහ තථ්‍ය ආදායම් හා වියදම් අතර සිදුවී තිබෙන වෙනස්වීම් පිළිබඳව කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ රීති ප්‍රකාරව වෙනස්වීම් පිළිබඳ කරුණු පැහැදිලි කිරීමේ ප්‍රකාශයක් ඉදිරිපත් කළ යුතු වේ. | අදහස් දක්වා නොමැත. |